**ඇලහැර ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

**----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 12 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජූනි 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------------

ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව 2017 වර්ෂයේදී ගෙවන ලද රු. 1,599,647 ක මුදල සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පෙර වර්ෂයන්ට අදාළව රැස්කරන ලද ක්ෂේත්‍ර ආදායම් රු. 81,000 ක් විවිධ තැන්පත් ලෙස දැක්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ජංගම වගකීම් වැඩියෙන් හා හිමිකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පෙරටු කාර්යාල සඳහා මිළදීගෙන තිබු රු. 51,367 ක ස්ථාවර වත්කම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 03 කට අදාල ශේෂයන් හා මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ සටහන් වල දක්වා තිබුණු ශේෂයන් අතර රු. 603,693 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) ගිණුම් විෂයයන් 2 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ වටිනාකම හා ඊට අදාළ ලේඛණ අනුව පැවති ශේෂයන්ගේ වටිනාකම අතර රු. 313,013 ක වෙනසක් පැවතුණි.

1.3.4 අවිනිශ්චිත ගිණුම

------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මුල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කර තිබු රු. 224,961 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 849,414 ක හිඟ හිටි වරිපනම් තුළ වර්ෂ 10 ක් ඉක්මවන ලද රු. 281,262 ක හිග හිටි වරිපනම් පැවති අතර එම මුදල් අයකර ගැනිම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 89,476,881 ක කර්මාන්ත ණයහිමියන් තුළ වර්ෂ 2-5 ත් අතර රු. 2,118,590 ක ශේෂයක් පවතින අතර එම මුදල් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

1.3.6 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

----------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 10 කට අදාළව එකතු වටිනාකම රු. 346,681,064 කට අදාළ අයිතිය තහවුරු කිරීමේ ලේඛණ, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා විස්තරාත්මක උපලේඛන යනාදි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරික්ෂා කිරිමට නොහැකි විය.

1.3.7 නිතී රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------

පහත දැක්වෙන නිති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය විය.

| නිතී, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) (ඕ) උප වගන්තිය | විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබානොගෙන රු. 102,500 ක මුදලක් සංග්‍රහ වියදම්, ශිෂ්‍ය වැඩමුළු හා අධ්‍යාපන උපකරණ ලබාදීම වෙනුවෙන් වැයකර තිබුණි.. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i) රීති 112 | යථෝක්ත රීතියෙන් අපේක්ෂිත අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් තොරව ගෙවීම් වවුචර් 07 ක් මඟින් රු. 3,720,804 ක් ගෙවීම තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | රීති 113 | යථෝක්ත රීතියෙන් අපේක්ෂිත අවශ්‍යතා ඉටුකිරීමෙන් තොරව රු. 1,008,564 ක අතුරුදවුම් ගෙවා තිබුණි. |
| (iii) | රීති 115 | ගෙවීම් වවුචර් 11 ක් මඟින් මිළදී ගන්නා ලද රු. 276,651 ක් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි සහතික නොමැතිව මුදල් ගෙවා තිබුණි. |
| (iv) | රීති 204 | 2015 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගන්නා ලද භාණ්ඩ වර්ග 10 කට අදාළ අයිතම 45 ක ඌණතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (v) | රිති 214 | සමාලෝචිත වර්ෂයට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2017 මැයි 17 දින වන විටත් සිදුකර නොතිබුණි. |
| (vi) | රීති 218 | පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සියලු ඉඩම් හා ගොඩනැඟිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරික්ෂා කරවීමට කටයුතු කළයුතු වුවත් සභාව විසින් කිසිදු දිනක සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි පරික්ෂා කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මු.රෙ. 104(1),(3),(4) | ප්‍රාදේශිය සභාව සතු කැබ් රථය 2016 ජුනි 17 දින අනතුරට භාජනය වීමෙන් රු. 526,479 ක අලාභයක් සිදුවී තිබූ අතර එම අනතුර |

| | | |
|---|---|---|
| | | සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 104 (2) | සමාලෝචිත වර්ෂයේ අනතුරට පත්වූ වාහන 02 කට අදාළ රු. 1,222,618 ක අලාභ හානි සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| (iii) | මු.රෙ. 156 (1) | නියමිත දිනට සභාව සතු කැබ් රථයක ආදායම් බලපත්‍ර ලබා නොගැනීම නිසා ගෙවා තිබෙන රු. 12,500 ක දඩ මුදල සහ සේවා නියුක්ති භාර අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාදවීම නිසා අධිභාර මුදල් වශයෙන් ගෙවා තිබුණු රු. 2,945 ක මුදල් සම්බන්ධව කටයුතු කර නොතිබුණි |
| (iv) | මු.රෙ. 1647(ඇ) | වාහන අළුත්වැඩියා සඳහා මිලදී ගත් රු. 128,315 ක් වටිනා භාණ්ඩ ලේඛන ගතකර නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ හා ලිපි<br>---------------------- | |
| (i) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3 (ආ) වගන්තිය | රු.1,283,279 ක් වූ වාහන අළුත්වැඩියා වියදම් ඇස්තමේන්තු සම්බන්ධයෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | පළාත් පාලන කොමසාරිස්ගේ NCP/LG/AC/04/01/02 හා 2015 දෙසැම්බර් 04 දිනැති ලිපිය | සභාපතිවරයා වෙත වෙන්කර ඇති නිල වාහනය 2015 දෙසැම්බර් මස සිට මසකට ලීටර් 150 ක උපරිම ඉන්ධන සීමාවකට යටත්ව ලේකම්වරුන් සඳහා |

භාවිතා කිරීමට අවසර ලබාදී ඇති නමුත් එම වාහනය සඳහා 2016 ජනවාරි සිට 2017 මාර්තු දක්වා කාලය තුළ අදාල සීමාව ඉක්මවා රු. 267,900 ක ඉන්ධන ලීටර් 2820 ක් භාවිතා කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන ආදායම ඉක්මවූ වියදම රු. 638,061 ක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 1,178,968 විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 345,751 | 218,176 | 849,415 |
| කඩකුලී | 496,162 | 530,494 | 190,535 |
| වෙනත් ආදායම් | 12,577,190 | 11,487,194 | 7,228,890 |

2.2.2 වරිපනම් හා බදු

-------------------

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශිය සභාවට අයත් බල ප්‍රදේශයෙන් අයවිය යුතු හිඟ වරිපනම් හා බදු මුදල රු. 849,415 ක් වූ අතර 2013 සිට 2016 ක කාලය තුළ හිඟ ශේෂය සියයට 54.5 කින් වර්ධනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ගෙවිය යුතු පුද්ගලයින් 171 දෙනෙකු වසර 5 සිට වසර 20 කට අධික කාලයක් වරිපනම් නොගෙවීම නිසා රු. 393,403 ක හිඟ ශේෂයක් දිර්ඝ කාලීනව ඉදිරියට ගෙන එමින් පැවති නමුත් ඒවා අයකර ගැනීමට ප්‍රාදේශීය සභා .පනතේ 158 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.2.3 කඩකුලී

----------

2016 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිය සභාවට අයත් කඩ කාමර 38 කින් රු. 190,535 ක හිඟ මුදලක් දක්නට ලැබුණු අතර ඉන් කඩ කාමර 14 කින් මාස 06 සිට මාස 30 ක කාලයක් තුළ අයවිය යුතු රු. 149,760 ක කුලී හිඟහිට තිබුණු නමුත් ඒවා අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.2.4 ජල ගාස්තු

---------------

ප්‍රාදේශිය සභාව මඟින් නඩත්තු කරනු ලබන ජල යෝජනා ක්‍රම 03 ක 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ජල ගාස්තු ආදායම රු. 347,137 ක් වි තිබුණි.

2.2.5 උසාවි දඩ

------------

විවිධ ආඥා පනත් යටතේ හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2016 දෙසැම්බර් 31 දිනට අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 5,617,851 ක මුදලක් ප්‍රාදේශිය සභාවට

ලැබිය යුතුව තිබූ අතර, 2013 සිට 2016 ක කාලය තුළ අයවිය යුතු හිඟ ශේෂයේ වර්ධනය සියයට 107 කින් වැඩි වී තිබුණි.

2.2.6 මුද්දර ගාස්තු

---------------

2016 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් රැස් කරන ලද රු. 1,263,902 ක මුද්දර ගාස්තු ප්‍රමාණයක් උතුරු මැද පළාත් සභාවෙන් ලබාගැනීමට ප්‍රාදේශීය සභාව කටයුතු කර නොතිබුණි.

2.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

(අ) සභාව සතු සහල් පිටි සැකසුම් මධ්‍යස්ථානයට අදාළ රු. 522,500 ක් වටිනා උපකරණ කට්ටලය වර්ෂ 5 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) රු. 69,500 කට මිලදීගෙන තිබුණු වඩු මැෂිම ප්‍රයෝජනයට නොගෙන වර්ෂ 6 ක පමණ කාලයක් නිෂ්කාර්යව සහා භූමිය තුළ අනාරක්ෂිතව පැවතුණි.

(ඇ) අංක NCRD-3371 දරණ ට්‍රැක්ටරය වර්ෂ 02 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) අංක 53-5057 දරන අබලන් වී ඇති කැබ් රථය වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අලුත්වැඩියාවකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) 2015 වර්ෂයේදී දිවිනැඟුම සංවර්ධන වැඩසටහන යටතේ ඇලහැර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මඩුදමන ජල ව්‍යාපාතිය සඳහා ලබාදී ඇති රු. 1,490,000 ක් වටිනා ජල පිරිපහදු යන්ත්‍රය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී සුධර්ශි බෞද්ධ මධ්‍යස්ථාන භූමියේ නව ටැංකියක් සවිකිරීමට හා බට එලීමට රු. 925,453 ක් වැයකර තිබුණද මෙතෙක් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහනයක් අනතුරකට පත්වීම නිසා සිදුකළ අලුත්වැඩියාව සඳහා දැරූ වියදම රු. 526,479 ක්වූ නමුත් රක්ෂණභාර අරමුදලින් ප්‍රතිපූර්ණය කළ මුදල රු. 428,523 ක් වූයෙන් ඉතිරි මුදල වූ රු. 97,956 ඊට වගකිව යුතු නිලධාරීන් තීරණය කර ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේදී අනුමත කරන ලද ගොඩනැඟිලි සැලසුම් 14 ක් සඳහා හා පෙර වර්ෂයේදී අනුමත කරන ලද කිසිදු සැලසුමක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.

(ඇ) දියබෙදුම හා බකමූණ මහජන පුස්තකාල වලට අනුබද්ධ නැණසල මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට විධිමත් ටෙන්ඩර් පරිපාටියකින් තොරව පුද්ගලයෙකු වෙත පවරා දී තිබුණි.

(ඈ) දූරගමන් සේවා බස් නැවතුමක් ඉදිකිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමෙන් තොරව මහවැලි ක්‍රීඩා පිටිය ඉදිරිපිට පිහිටි කළුගල කඩා ඉවත් කිරීම ආරම්භ කර තිබුණු අතර බස්නැවතුම්පලක් ඉදිකිරීම සඳහා පිහිටි බිමක් තෝරාගැනීම වෙනුවට කළුගලක් සහිත ඉඩමක් තෝරාගැනීම නිසා එම ගල කැඩීම සඳහා මේ වන විට රු. 10,448,073 ක් වැයකර තිබුණු නමුත් තවදුරටත් මෙම කළු ගල කැඩීම වෙනුවෙන් රු. 24,141,706 ක් වැයකළ යුතු බවට ඇස්තමේන්තු කර තිබුණි.තවද මෙම කළු ගල කඩා ඉවත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අවසරයක් ලබාගෙන නොතිබුණු අතර එය කඩා ඉවත් කිරීම සඳහා විවෘත මිළ ගණන් කැඳවීමක් සිදුකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රු. 56,595 ක් වටිනා ස්ථාවර වත්කම් අපහරණය කිරීමකින් තොරව වත්කම් ගිණුම් වලින් ඉවත් කර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් වසර ගණනාවක සිට භාවිතයට ගෙන තිබූ වාහන 09 ක අයිතිය සභාවේ නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු ක්‍යෑ කැබ් රථයක සහ ට්‍රැක්ටරයක මයිලෝ මීටරය වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අක්‍රීයව පවතින අතර එම මීටර් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මිලදී ගෙන තිබුණු එකතුව රු.5,301,701 ක් වූ ස්ථාවර වත්කම් අදාල ස්ථාවර වත්කම් ලේඛන හා ඉන්වෙන්ට්‍රි ලේඛන වල සටහන් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව විසින් පවුල් 796 ක් සඳහා පානීය ජලය සපයනු ලබන ජල ව්‍යාපෘති තුනෙහිම ජලය පානය කිරීමට නුසුදුසු බවට ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලයේ රසායනාගාර පරීක්ෂණ වලින් තහවුරු වී තිබුණි.

(ඉ) සියඹලාව ජල ව්‍යාපෘතියෙහි ජල පෙරණය පිළිසකර නොකිරීම හේතුවෙන් වර්ෂ කිහිපයක සිට ජල පෙරණය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඊ) මඩුදමන ජල ව්‍යාපෘතියෙහි පොම්පාගාරය නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවෙන් අඛණ්ඩව ජලය සැපයීමට නොහැකි වී තිබුණි.

3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

ඇලහැර ප්‍රාදේශීය සභාව සතුව ග්‍රාමසේවා වසම් 28 ක් පැවතුණද, බකමූණ හා දියබෙදුම යන ප්‍රදේශවල හා අත්තනකඩවල පොල භූමිය යන ස්ථානවල පමණක් කසල එකතු කරනු ලබන අතර එසේ දෛනිකව එකතු කරනු ලබන ටොන් 03 ක් පමණ කසල වර්ගීකරණයක් සිදු නොකර වන රක්ෂිතයට මුදාහරිනු ලබන බවත් එසේ මුදාරහැරීම හේතුවෙන් වන අලින් ඇතුළු වනජීවීන්ගේ ජීවිත වලට එය තර්ජනයක් වියහැකි බවත් නිරීක්ෂණය විය.

3.4 හඳුනාගත් අලාභ

--------------------

(අ) සභාව විසුරුවා හැරීමෙන් පසු මන්ත්‍රීවරුන් විසින් පෞද්ගලික පරිහරණය සඳහා රැගෙන ගොස් තිබූ ජංගම දුරකථන 6 ක් 2017 මැයි 31 දින වන විටත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආදායම් පරිපාලක තනතුරේ සේවය කළ නිලධාරියෙකු විසින් ක්ෂේත්‍ර ලදුපත් අවභාවිතා කරමින් රැස්කරන ලද ආදායම් සාවද්‍ය ලෙස බැහැර කර තිබුණු බව ක්ෂේත්‍ර නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. එසේ ලබාගත් රු. 172,500 ක මුදල අවභාවිතා කිරිම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2017 මැයි 30 දින වන විටත් ගෙන නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ණයගැති/ණයහිමි පාලනය

(ඈ) වාහන පාලනය